NSB

# ජාතික ඉතිරිකිරීමේ බැංකුව

# ඇබෑර්තු

## මෝටර් කාර්මික තනතුර - VII ශ්‍රේණිය (කුසලතා මට්ටම 1)

**සුදුසුකම් ලැබීම පිණිස සපුරාලිය යුතු අවශ්‍යතා**

**1) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.**

**2) අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් :**

- අ.පො.ස. (සා/පෙ) විභාගය එකවර විෂයයන් 6 ක් සහිතව සමත්වීම

සහ

- පිළිගත් ආයතනයකින් අවම වශයෙන් එක් අවුරුදු පූර්ණ කාලීන මෝටර් කාර්මික ඩිප්ලෝමාවක් / සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හෝ NVQ Level 3 (මෝටර් කාර්මික) මට්ටම සම්පූර්ණ කර තිබීම.

සහ

- බර වාහන පැදවීම වලංගු රියදුරු බලපත්‍රලාභියෙකු වීම.
- හයිබ්‍රිඩ් හා ඉලෙක්ට්‍රික් වාහන පිළිබඳ මූලික දැනුම් සහිත වීම.

**3) පළපුරුද්ද**

රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මෝටර් කාර්මිකයෙකු ලෙස අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද ලබා තිබීම. (සේවා පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.)

**4) වයස් සීමාව**

- වයස අවුරුදු 40 ට අඩු විය යුතුය

**5) කුසලතා**

- සාමාන්‍ය රාජකාරී වේලාව ඉක්මවා හා සති අන්ත / නිවාඩු දිනවලදී සේවයේ යෙදීමට ඇති හැකියාව.
- දෝෂ හඳුනාගැනීමේ උපකරණ (diagnostic tools) භාවිතය පිළිබඳ දැනුම හා හැකියාව
- නියම කර ඇති කාලසීමාව ඇතුළත වැඩ නිමකිරීමේ හැකියාව

**6) කාර්යභාරය හා වගකීම්**

- බැංකුවේ වාහන අලුත්වැඩියා කිරීම හා පවත්වාගෙන යාම
- වාහනවල දෝෂ දෛනිකව පරීක්ෂා කර කළමනාකරුට වාර්තා කිරීම
- වාහන පිළිබඳ වාර්තා (Maintenance record) පවත්වාගෙන යාම

**7) තෝරා ගැනීමේ ක්‍රමවේදය**

ලිඛිත පරීක්ෂණයක්, ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

**8) පත්වීමට අදාළ නියමයන්**

මෙම තනතුර ස්ථිර සේවයට අදාල වන අතර, වසරක පරිවාස කාලසීමාවකට යටත්ව පවතී.

**9) වැටුප**

රු.36,565 - රු.41,765/-

(260 X 20)

මූලික මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු.120,000/- ක් පමණ වනු ඇත.

**අයදුම්පත් යොමු කිරීම**

අයදුම්කරුවන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ (www.nsb.lk) පළ කර ඇති ආදර්ශ අයදුම්පත භාවිතා කළ යුතු වේ. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත 2024.06.10 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනය වෙත ලැබීමට සළස්වන්න.

ඉහත සඳහන් කරන ලද ක්‍රමවේදය හැර වෙනත් ක්‍රමවේදයන් භාවිතයෙන් අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතුය.

අදාළ සහතිකවල පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. එලෙස සහතිකවල පිටපත් අයදුම්පත සමග අමුණා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවේ.

මේ සම්බන්ධයෙන් සිදුකරන ඕනෑම ආකාරයක බලපෑමක් මෙම තනතුර සඳහා ඉල්ලුම්කිරීමට නුසුදුසුකමක් ලෙස වහාම සැලකීමට හේතු වනු ඇත. තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.

අයදුම්කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන),**
**මානව සම්පත් සංවර්ධන අංශය,**
**ජාතික ඉතිරිකිරීමේ බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය, කොළඹ 03.**

Call Centre - 0112 379 379
www.nsb.lk
"[SL] AAA Stable"
100% Government guarantee
National Savings Bank, The Safest Place For Your Money
NSB